26 වන පිටෙන්

පරිසමාප්ත ගීතයේ ඇසෙන "මගෙ සුදු ඕළු මලේ", "සුසුම් හෙලන්නේ කඳුළු සලන්නේ" " සියලඟ කඳුළු සලා" වැනි ඛණ්ඩ ගායනයේදී සුනිලූනුන් කටහඬ හා ස්වර හසුරුවා ඇති සූක්ෂ්ම ආකාරය, තමනට ශක්‍යතා ඇති, තමා ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන සිටි රාගධාරී සංගීතයේ හමුවන ගායනා ක්‍රම වලින් දුරස්තරවී, සිංහල භාෂාවේ ශබ්ද ධර්මයන්ට අනුකූලව ගායනා ක්‍රමයක් යොදා ගැනීමට සුනිලූනුන් යෙදු වෑයමේ සාර්ථක පලයක අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.

එදා සිදුවූ කතාබහ තුලින් මතුවූ රසවත් සියලූ දෑ අලලා සටහනක් කිරීමට අවස්ථාව මෙය නොවුවද, මගේ ප්‍රශ්නයන්ට පිළිතුරු වශයෙන් සුනිලූනුන් කළ ප්‍රකාශන දෙකක් පමණක් මෙම ලිපියෙහි ඇතුලත් කිරීම වැදගත් වෙවියි සිතමි. අමරදේවයන් සමග ඔහු හවුලේ සංගීත පන්ති පැවැත් වූයේ කවර වකවානුවකදැයි මා ඇසූ විට ඔහු දුන් පිළිතුර වුයේ, එවක තරුණ වයලින් වාදකයකු ලෙස ඔහුට සම්බන්ධව සිටි අමරදේවයන් බලවත් ආර්ථික දුෂ්කරතා නිසා සංගීතය අතහැර දමා යාමට තරම් කල කිරී සිටි බව තමා සමග වරක් පැවසූ බවත්, එනිසාම ඔහුට කරන උපකාරයක් හැටියටත්, සංගීතයෙහි තව දුරට නියැලීමට අත් වැලක් ලෙසත්, තමාගේ සංගීත පංතියක් ඔහුට භාර දුන් බවත් ය. මෙම



ප්‍රකාශනය සනාථ කල හැකි ලිඛිත සාක්ෂි ඇත. හෙළයේ මහා ගාන්ධර්වයා ලෙස අප කාගේත් ආදරයටත් ගෞරවයටත් ලක්වී සිටින අමරදේවයන් එකල තමනට සුනිලූන්ගෙන් ලැබුණු නොමසුරු සහයෝගය හා සිය සංගීත හැකියාවන් දියුණු කර ගැනීමට සුනිලූන් දුන් උවදෙස් හා උපකාරයන් පිළිබඳව කෘතඥව සිහිපත් කරනු මා දැක ඇත.

පේරාදෙණිය ඉංජිනේරු පීඨයේ කලා කවය වෙනුවෙන් විශ්ව විද්‍යාලයට පැමිණ ගීත ගැයීමට අප ආරාධනා කළ විට, එම ආරාධනාව එකහෙලා තරයේ ප්‍රතික්ෂේප කල සුනිලූන් "සංගීතයට මගේ හිත ඇදී ගිය එක තමා මා කල ලොකුම වරද" යයි පවසනු මට මතකය. මෙම ප්‍රකාශනය කරන විට ඔහුගේ මුහුණ එකවරම අඳුරු ශෝකී පැහැයක් ගත් අයුරු මට අදත් සිහියට නගා ගත හැකිය.

ගීත රචකයකු වශයෙන් සුනිල් සාන්ත වැදගත් වනුයේ ඔහු ආනන්ද සමරකෝන් යුගයත්, මානවසිංහ යුගයත් යා කල ප්‍රධාන පුරුක වීමය නිසාය. ග්‍රැමෆෝන් තැටි ඇසුරෙන් නිර්මාණාත්මක සංගීතය හා ගීත රචනය යනු කුමක්දැයි සමරකෝන් මුල්වරට පෙන්වා දුන්නේ සුනිල් සාන්ත ප්‍රවිෂ්ඨ වීමට ඉහතය. මානවසිංහ ගීත සාහිත්‍යයේ වෙනසක් කළේ ගුවන් විදුලි නාටක හා ගුවන් විදුලි ගී තුලින් 1950 ගණන් වලය. සුනිල් ආරියරත්නයන් ප්‍රමුඛ ඇතැම් විචාරකයන්ගේ සැලකිල්ලට එතරම් ලක් නොවුවද අබේසිංහයන් පෙන්වා දෙන පරිදි සුනිල් සාන්ත අපූර්ව නිර්මාණ ශක්තියෙන් හෙබි කවි බසින් හා කවි සිතිවලින්ද නො අඩු දක්ෂ ගීත පද රචකයකු විය. එසේම සුනිලූනුන් ගීත රචනයට ප්‍රවිෂ්ඨ වූයේ මානවසිංහ ගුවන් විදුලියට ප්‍රවිෂ්ඨ වීමටත්, ග්‍රැපමෆෝන් තැටි සඳහා ගීත රචනා කිරීමටත් බොහෝ කලකට ඉහතය. ප්‍රතිපත්තියක් වශයෙන් ගුවන් විදුලි තැටි සඳහා පමණක් ගී ගැයූ සුනිලූන්ගේ මුල්ම ගී තැටි පටිගත වුයේ 1946 දී වුවද ඔහුගේ මුල් යුගයේ ජනයා අතරට ගිය ඇතැම් ගීත, රචනා වුයේ 1945 මුල් භාගයේදී ඔහු රක්වාන විසූ කාලයේදී බවට සාක්ෂි තිබේ. සිංහල ගීතයේ කාව්‍යාත්මක ශික්ෂණය ඇරඹුණේ සුනිලූන්ගේ ගී රචනා තුලිනියි, අබේසිංහයන් කර ඇති නිගමනය නිවැරදිය. ගීත රචනයේ දී මුලින්ම තමනටද ගුරු වුයේ සුනිල් සාන්ත බව අරිසෙන් අහුබුදු පවසනු මා අසා ඇත.

1952 දී ගුවන් විදුලියේ වැඩ තහනමට ලක්වූ පසු ඔහු කල කී දැයෙන් ප්‍රකට වුයේ හැම දෙයක් පිලිබඳ කලකිරුණු ස්වභාවයකි. තමා 1952 දී ඝාතනය වූ බව සුනිලූන් කිහිප තැනක ලියා තිබෙනු මා කියවා ඇත. ""නිර්මාණයක් කරන කෙනෙකුට යමක් කරන්නට ඉඩක් නොලැබෙන රටක ජීවත් වීම පවා මහා සාපයකි" යනු ලංකාදීප පුවත් පතට ඔහු 1955 ජනවාරි මස 30 දී ලියූ ලිපියකින් උපුටා ගත් පාඨයකි. යම් යම් අයගේ බලවත් ඇවටිල්ල නිසාම පසුව වරින් වර සුනිලූන් සංගීතයට යොමු වූ නමුදු, මුල් යුගයේ තිබුණු ජවය හා උද්යෝගය පසුව ඔහු තුල නොවූ බව සුනිලූන් ඇසුරු කල එච් එම් ගුණසේකර වැනි මාධ්‍යයි වේදීන් පෙන්වා දී ඇත. සංගීතය ගැන නම් ඔහු කිසි විට කලකිරුනේයැයි සිතිය නොහැකිය. එසේ වුවා නම්, දෙවන යුගයේදී (1967),සරඳ වලා ගැබ, පෝ දා දහම් සිසිලේ, සාදු හඬින් ලළුම්බා ගංගා, වලාකුලින් බැස වැනි රම්‍ය නිර්මාණ බිහි වන්නේ නැත.

රේඛාව (1956) හා සංදේශය (1960) තුලින් ඔහු සිනමා ගීයේ විශාල වෙනසක් කළේය. 1967 දී ගුවන් විදුලිය වෙනුවෙන් මධුර මධු, රන් වලාව වැනි වැඩ සටහන් තුලින් සීමිත ස්වර සංඛාවකින්, ඔහුගේ මුල් යුගයේ ගී ආරට හාත්පසින් වෙනස් ආරකින් යුතු මධුර ගී රැසක් ඉදිරිපත් කළේය. තනි ස්වරයෙන් ඔහු නිර්මාණය කල බඹර ගීතය ඔහුගේ සුවිශේෂ නිර්මාණ හැකියාවන් පිළිඹුබු කරන අවස්ථාවක් ලෙස බොහෝ විචාරකයෝ දකිති. 1978 දී තැටියට නැගුනු ස්වර හතරකින් නිර්මාණය වූ සීගිරි කුරුටු ගී ද පසු යුගයේ ඔහුගේ සුවිශේෂ නිර්මාණ ලෙස සැලකේ..

ජනප්‍රියත්වයේ මුදුන් පෙත්තේ වැජඹෙන විට ගුවන් විදුලියේ වාරණයට යම් හෙයකින් හෝ ලක් නොවී, ගුවන් විදුලි බලධාරීන්ගේද සහයෝගය ඇතිව, අඛණ්ඩව නිර්මාණ කරණයේ යෙදෙන්නටත්, ගීත ගායනෙහි යෙදෙන්නටත්, තව දුරටත් සතතාභ්‍යාසයෙහි යෙදෙන්නටත් සුනිලූන්ට අවකාශ ලැබුනේ නම්, මීට වඩා කතා කල හැකි පරිපූර්ණ ගීත සමූහයක් / සම්ප්‍රදායක් ඔහු අතින් නිර්මාණය වීමට ඉඩ තිබුන බව අපට නිසැකවම වාගේ තීරණය කල හැකිය. එය එසේ නොවීම කණගාටුවට කරුණකි.

එසේම භාත්ඛන්ඩයේ විශාරද උපාධි වලින් ඉහලින් පිදුම් ලද සුනිලූන්, විශාරද සුනිල් සාන්ත යනුවෙන් හැඳින්වීමට, මාධ්‍යාන් හා රචකයන් තවමත් මැලි වනුයේ උඩුගං බලාගිය සුනිලූනුට විරුද්ධව එදා ප්‍රබලව නැගී ආ අභිමතයන් හා අවිචාරවත් ආකල්ප තවමත් දුරු වී නැති නිසා විය යුතුයි සිතේ.

